# කුරුණෑගල, මයුරාවතී රජමහ විහාර සෙල් ලිපිය පිළිබඳ අධ්‍යයනයක්

ශ්‍රීමාලි සිරිවර්ධන*
ක්‍රිෂාන්ති මධුමාලි ජයකොඩි**

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
*srimalisiriwardhana91@gmail.com , **madujayakody91@gmail.com

ප්‍රමුඛ පද: මැටියගනේ, බදු, සෙල්ලිපි, කඩහක හා සිලවිය, බ්‍රාහ්මීය

## හැඳින්වීම

යම් ජාතියකගේ සංස්කෘතිය එළි දක්වන විවිධ තේමාවන් යටතේ එනම් ආගමික, දේශපාලන හා සාමාජීය තොරතුරු විදහාපාන සෙල්ලිපි සිංහල භාෂාවේ සහ සිංහල අක්ෂර ක්‍රමයේ ක්‍රමානුකූල විකාශනය හා පරිණාමය පැහැදිලි කරන්නකි. ලක්දිව ඉතිහාසයේ විවිධ යුගයන්හි ලියවුන සෙල්ලිපි විශාල ප්‍රමාණයක් දැකිය හැකි අතර වත්මන අප සතුව පවත්නා ශිලා ලේඛන ප්‍රමාණය 3000ක් පමණ වේ. ඒ අතරින් වු ඉපැරණි සෙල් ලිපියක් ලෙසින් මැටියගනේ රජ මහාවිහාර සෙල් ලිපිය පෙන්වා දිය හැකිය. ඓතිහාසික දඹදෙණිය රාජධානියට අයත් මෙම විහාරස්ථානය වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ නාරම්මල නගරයට නුදුරින් පිහිටා ඇත.

අනුරාධපුර යුගයේ 2 වැනි හා 4 වැනි ශත වර්ෂ වලට අයත් වෝහාරතිස්ස හා මහානාම යන රජවරුන්ගේ කාලයේ දී මෙම විහාරස්ථානය ආරම්භ වී යුගයෙන් යුගය ප්‍රතිසංස්කරණ සිදුකර ඇති අතර මෙමහ හව්ලුව විහාරය කෝට්ටේ රාජධානියේ 6 වැනි පරාක්‍රමබාහු රජතුමා විසින් ව්‍යවහාර වර්ෂ 1429 වර්ෂයේ දී පිරිනමන ලද තඹ සන්නසෙහි ද සඳහන් ය. හයවන පැරකුම්බා රජතුමාගේ මිත්තනිය වූ මයුරාවතී දේවිය විසින් අස්ගිරි විහාරවාසී වැඩසිටි දඹදෙණි මා හිමි බංඩාරගේ පරපුරේ දේව රක්ඛිත හිමියන්ට මෙම හව්ලුව විහාරය පූජාකර ඇත. මහනුවර යුගයේ දී දෙවන රාජසිංහ රජතුමා විසින් ද ව්‍යවහාර වර්ෂ 1675 වර්ෂයේදී මෙහි උඩ මළුව විහාරය කරවා අස්ගිරි විහාරයේ ගුණදානේ ධම්මදස්ස නායක තෙරුන් වහන්සේට රිදී සන්නසකින් පූජා කර ඇත. අතීතයේදී රහතන් වහන්සේලා වැඩසිටි ස්ථානයක් ලෙස ද මෙම ස්ථානය පෙන්වා දිය හැකි ය. සෙල් ලිපියේ සඳහන් පරිදි මෙහි සිටි භික්ෂූන් වහන්සේට කඩහක වැව හා සිලවිය යන ස්ථාන වල බදු වර්ග 2ක් පූජාකර ඇති බවක් දැක්වේ. මෙම ශිලා ලිපියෙහි කතෘ නිශ්චිත වශයෙන් හඳුනාගත නොහැකි ය. නමුත් ක්‍රි.ව 1, 4 සියවස් වලට අයත් පාලන කාලය තුළ සිටි රාජ්‍ය පාලකයකු විසින් මෙය කරන ලද්දක් බව සැලකේ. වත්මන වනවිට විධිමත් නඩත්තුවක් නොමැති නිසාවෙන් මෙය තරමක් දුරට විනාශයට පත් වෙමින් යන ආකාරයක් දැකිය හැකි ය. ඓතිහාසික මෙම විහාර භූමියේ ප්‍රධාන බෝ මළුවට වයඹ දිග දිශාවෙන් මීටර් 30ක් පමණ දුරින් පිහිටි මෙම ශිලා ලිපිය යම් තරමක් දුරට මනා තත්ත්වයකින් තවමත් පැවතිය ද එහි තැනින් තැන පළුදු වී ඇති ආකාරයක් දක්නට ලැබේ. ගලේ තැනින් තැන පුපුරා ගොස් ඇති බැවින් අක්ෂර හඳුනාගැනීම තරමක් අපහසු ය.

මෙම සෙල් ලිපිය අධ්‍යනය කිරීමේ අපේක්ෂිත අරමුණු වූයේ එහි අක්ෂර හා භාෂාව හඳුනාගැනීම, අක්ෂර කොටා ඇති

ආකාරය, මතුපිට පුවරුව සකස් කරගත් ආකාරය, අක්ෂර කෙටීමේ ශිල්ප ක්‍රමය, අක්ෂර කෙටීම සඳහා පේළි සකස් කර ඇති ආකාරය හඳුනාගැනීම මෙන්ම එතුළින් ගම්‍යවන ආර්ථික දේශපාලනික වශයෙන් ඇති වැදගත්කම සොයා බැලීම ද අපේක්ෂා කරන ලදි.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණ සඳහා අධ්‍යයන ක්‍රමවේදය ලෙස ක්ෂේත්‍ර ගවේෂණය හා මූලාශ්‍ර අධ්‍යනය මගින් දත්ත රැස්කිරීම සිදුකෙරිණි. රැස්කරගත් දත්තයන් මගින් තොරතුරු විශ්ලේෂණය කිරීම සිදුකෙරෙන අතර එම දත්ත වාර්තා ගත කිරීම සඳහා ඡායාරූප ගැනීම සිදුවිය.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

මයුරාවතී සෙල්ලිපිය අධ්‍යයනයේ දී විශේෂයෙන්ම බොහෝ කාරණාවන් රැසක් අනාවරණය කරගත හැකිවිය. එහිදී ආර්ථික, දේශපාලනීය වශයෙන් හා ආගමික වශයෙන් වැදගත් ස්ථානයක් විය. මෙම විහාරය අතීතයේ සිටම සියවස් ගණනාවක් යනතුරු රාජ්‍ය අනුග්‍රහයට ලක්ව ඇත. සෙල් ලිපියේ සඳහන් පරිදි මෙහි සිටි භික්ෂූන් වහන්සේට කඩහක නම් වැවෙහි හා සිලවිය නම් ස්ථානයේ බඳු වර්ග දෙකක් පූජා කර ඇති බවක් දැක්වේ. ඒ අනුව භික්ෂූන් වහන්සේලාගේ හා මෙම විහාරයේ පැවැත්මට එකල රජවරු ක්‍රියාමාර්ග ගත් ආකාරයක් දක්නට ලැබේ.

මෙහිදී ප්‍රධාන වශයෙන් අක්ෂර පිළිබඳ අධ්‍යයනයක් සිදු වූ අතර එම අක්ෂර අපර බ්‍රාහ්මීය අක්ෂර ලෙස හඳුනාගත හැක. එමෙන්ම චතුරස්‍රාකාර හැඩයකින් යුක්ත මෙම සෙල්ලිපිය කොටා ඇත්තේ පිහිටි ගලක් මතය. එහි දිග අඩි 12ක් හා පළල අඩි 5කි. මෙය පේළි 4කින් සමන්විත වන අතර පේළි 2ක් අතර පරතරය අඟල් 3කි. අකුරු එතරම් ගැඹුරට කොටා ඇති බවක් දක්නට නොලැබේ. එහි ගැඹුර අඟලකින් 1/4 කි. එක් අකුරක ප්‍රමාණය අඟල් 3ක් පමණ වන අතර එක පෙළට එකක් නොවන වශයෙන් ලියා ඇති ආකාරයක් දක්නට ලැබේ. එබැවින් පේළි කියවීම තරමක් දුෂ්කරය. ඇතැම් අක්ෂර මැකීගොස් ඇති ආකාරයක් ද දක්නට ලැබේ. එබැවින් පේළි අතර වචන ගලපා ගැනීම දුෂ්කර කාර්යයකි. මෙහි සඳහන් අක්ෂර හා භාෂා ලක්ෂණ දෙස බලන විට ක්‍රිස්තු වර්ෂ ආරම්භයේ භාෂා ලක්ෂණ හඳුනාගත හැක. විශේෂයෙන්ම අපර බ්‍රහ්මී යුගය භාෂා පරිණාමයේ මුල් අවධියයි. මෙහි අන්තර්ගත භාෂාව පුරාණ සිංහල භාෂාවකි.

මෙම සෙල්ලිපිය ක්‍රි.ව 01 සියවසට අයත් බැව් පෙන්වා දිය හැකිය. ඒ බැව් ඒ හා සමාන අක්ෂර ඇති සමකාලීන සෙල්ලිපි තොරතුරු අධ්‍යයනය කිරීම තුළින් හඳුනාගත හැකිය. එසේම මෙහි කතෘ නිශ්චිත වශයෙන් හඳුනාගැනීමට නොහැකි අතර ක්‍රි.ව 01 -04 සියවසට අයත් රාජ පාලකයෙකු විසින් මෙය කරන ලද්දක් බව පෙන්වා දිය හැකි ය. එමෙන්ම මෙම සෙල්ලිපිය වෙස්සගිරි ලිපි මෙන් ඉතා කුඩා සෙල්ලිපියකි. ආර්ථික, දේශපාලන හා සමාජ තත්ත්වයන් පිළිබඳ මෙම ලිපිය අධ්‍යයනය තුළින් හඳුනාගත හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ


වික්‍රමසිංහ, සිල්වා.ඩී.එම්, (2000) ***ශිලා ලේඛන සංග්‍රහය,*** පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, සද්ධාමංගල කරුණාරත්න පරිවර්තනය, කොළඹ.

හැලෝගම, විමලසේන (2003) ***ශ්‍රී ලාංකීය බ්‍රාහ්මී අක්ෂර මාලාවේ ආරම්භය.*** ජයන් ප්‍රින්ට් ග්‍රැෆික්ස්, ගනේමුල්ල.

ධම්මානන්ද හිමි, මකුරුප්පේ (2000) ***සිංහල ශිලා ලිපි මාලා (විමර්ශනාත්මක).*** සමයවර්ධන පොත්හල (පුද්ගලික) සමාගම, කොළඹ.